පෘතුගාලයෙන් තිලින ලද්දක් වූ කතෝලික දහම සමග ලාංකික වැසියන් එදාමෙදා තුර අපමණ භක්තියකින් බැඳී සිටිති
ජේසු මැණියෝ මව් තනතුරේ හිඳුවා ගරු කරන ඔවුහු පවුලේ කාන්තා චරිතයන්ට  නිසි ස්තානය ලබා දෙන්නට දෙවරක් නොසිතති.

එමෙන්ම වර්ෂය පුරාවටම මාසයෙන් මාසයට ඒ ඒ පල්ලි ප්‍රදාන කරගෙන උත්සව පවත්වන ඔවුහු එවන් සුවිශේෂ දිනයන් හීදී රැකියා නිවාඩු ගෙන ඒවාට සහභාගී වීමට වසර මුල සිට සූදානම් වෙති.
මඩු දේවස්ථානය , තලවිල ශාන්ත ආනා දේවස්ථානය මාරවිල සිරි කුරුස දේවස්ථානය ,කඳාන සෙබස්තියන් දේවස්ථානය ,තේවත්ත බැසිලිකා දේවස්ථානය ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ දේවස්ථාන වලින් කිහිපයකි
එසේම දේවදූත වන්දනාව ද ශ්‍රී ලාංකික කතෝලික ජනතාව සිදු කරනු ලබන අතර
සෙබස්තියන් මුනිඳු මිකාඑල් අග්‍රදූත තුමා ආනා මුනිතුමිය
නිකොලස් මුනි තුමා වෙනුවෙන්ම වෙන්වූ සුවිශේෂී දේවස්ථානද ලංකාව පුරා විසිරී පවතී

කතෝලික පවුලක අලුත උපන් බිලිදෙකු මසක් පිරීමට ප්‍රතම බව්තිස්මය ලබා දෙන අතර ජපානයේ ඒ සඳහා පිරිමි ළමයෙකුට  කතෝලික පිරිමි පුද්ගලයෙක් හා ගැහැණු දරුවෙකුට කතෝලික කාන්තාවක් කැපකරැ වුවද ශ්‍රී ලංකාවේ දී එයට කැපකරු මව පියා යන අර්ථය සහිතව ගැහැණු සහ පිරිමි පුද්ගලයන් දෙදෙනෙකු සහභාගී කර ගනී.
එතැන් පටන් ඔවුහු එම දරුවා පිලිබඳව වගකීමකින් කටයුතු කරන අතර එම දරුවාද තම දෙමව්පියන්ට සේම කැපකරු මාපියන් වද ගරුකරති වග වෙති.
ඔවුන් වයස් පිරීමෙන් කතෝලික පාසල් වල දී ප්‍රාතමික අද්‍යාපනය අරබති. එම පාසල් පල්ලිය ප්‍රදාන කර ගෙන පියතුමන් සහ සහෝදරියන්ගේ මූලිකත්වයෙන් කටයුතු කරති .
වයස පිරීමෙන් අබිවුර්දි ආලේපය ලබති
විවාහය කතෝලික අයෙකු සමග නම් පූර්ණ දේව මෙහෙයද
කතෝලික නොවන අයෙකු සමග නම් අර්ද දේව මෙහෙයක්ද සිදු කරති.එතැන් පටන් ''වාසනාවත් කල්හීද අවාසනාවන්ත ලෙඩ දුකේදී හා සුව සැපේදීද ඔබට විශ්වාසවන්ත වෙන්න පොරොන්දු වෙමි ''යන දේව වාකය පෙරදැඩිව ප්‍රේමයෙන් සාමයෙන් යුතු ව දිවිගෙවති

සෑම ඉරිදාවකම  නොවරදවාම දේවස්ථානයට යන ඔවුහු අලු බදාදාව මහ සිකුරාදාව  පාස්කු ඉරිදාව නත්තල මහත් හරසරින් සමරති

2017 වර්ෂයේ ආදර සම්බන්ධයක් ආරම්භ කල අපි2021 වර්ෂයේ දෙසැම්බර් 26 වනදා අපගේ විවාහය කුමමොතෝ තෙදොරි දේවස්ථානයේදී සිදු කරන ලදී
2022 වර්ෂයේ සිට තොසු නගරයේ පදිංචි වී සිටින අප නොවරදවාම ඉරිදා දේව මෙහෙයට සහභාගී වන අතර  2023 වර්ෂයේ අටවන මස උපත ලද අපගේ වැඩිමල් පුතු කියාමා දේවස්ථානයේ දී ශාන්ත නිකොලඩ් තුමාගේ නාමයෙන් බෞතීස්ම කරන ලදී .මේ වර්ශයේ ජුනි මස උපත ලද අපගේ දෙවන පුතුද තොසු දේවස්ථානයේ දී ශාන්ත මිකාඑල් තුමාගේ නාමයෙන් බෞතීස්ම කරනු ලැබීය
ඔවුන් කුසයේ සිටිය දීම ඔවුන් සමග එක්ව යාච්නාවෙන් දවස ඇරඹූ අප යාච්නාවෙන්ම දවස අවසන් කරමු.
ඔවුන් නිදුක් නීරෝගීව  ආගමට ලැදිව කටයුත කරනු දැකීම අපි දෙදෙනාගේම අපේක්ෂාව වන අතර නිරන්තරයෙන් ඒ පිලිබඳව දෙවියන් වහන්සේට යාච්නා කර සිටිමු.